## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
## මිහින්තලේ

(සෑම නවක ප්‍රවේශකයෙක්ම සිය විශ්වවිද්‍යාල අයදුම්පත් කට්ටලය සම්පූර්ණ කිරීමට ප්‍රථම මෙම විස්තර පත්‍රිකාව හොඳින් කියවා අවබෝධයට ගෙන ඒ අනුව අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර එවිය යුතුය.)

ශිෂ්‍ය ලියාපදිංචි අංකය ................................/2013/2014..........................

.................................................................................................... හිමි/මයා/මෙය

ස්වාමින් වහන්ස, මහත්මයාණෙනි, මෙනවියනි,

අතීත ශ්‍රී විභූතියත් ජාතික උරුමයත් පිළිබඳ ප්‍රෞඪ ඉතිහාසයක් ඇති අනුරාධපුර මිහින්තලාව ආසන්නයේ පිහිටි ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට අනුයුක්තව උපාධි පාඨමාලාවක් හැදෑරීමට ඔබට උදාවූ අගනා අවස්ථාව පිළිබඳ අපගේ බලවත් සතුට මෙසේ ප්‍රකාශ කර සිටින්නෙමු. එසේම ඉදිරි වසර කීපය තුළදී ඔබ ද විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රජාවේ විනය ගරුක ශිෂ්‍යයෙකු ලෙස කටයුතු කරනු ඇතයි හුදෙක් ම අපේක්ෂා කරන අතර ඔබගේ අධ්‍යයන කටයුතු සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනා කරන්නෙමු.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨයන් හා ඒවායේ සංකේතයන් පහත දැක්වේ.

01. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය - SSH
02. කළමනාකරණ අධ්‍යයන පීඨය - MG
    i. සංචාරක හා සත්කාරක කළමනාකරණ අධ්‍යනාංශය - MG/THM
03. ව්‍යවහාරික විද්‍යා පීඨය - AS
    i. ජීවවිද්‍යා අධ්‍යනාංශය - AS/B
    ii. භෞතික විද්‍යා අධ්‍යනාංශය - AS/P
    iii. සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයනාංශය - AS/HP
    iv. තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අධ්‍යනාංශය - AS/ICT
04. කෘෂිකර්ම පීඨය - AG
05. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය - MED

මෙම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක ලෙස ලියාපදිංචි වීම සඳහා ඔබ විසින් නිසි පරිදි පුරවා එවිය යුතු අයදුම්පත් හා ඒ සම්බන්ධ ලේඛන කීපයක් මේ සමග අමුණා ඇත.

එම පෝරම සම්පූර්ණ කර එවිය යුතු ලිපිනයන් සහ අදාල අනෙකුත් විස්තර පහත වගුවේ දැක්වේ.

| අනු අංකය | ලේඛනය | එවිය යුතු අවසන් දිනය | එවිය යුතු ලිපිනය | වැඩි විස්තර සඳහා විමසීම් |
|---|---|---|---|---|
| 01. | ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ විශේෂ කුසලතා ලේඛන (SR 1) | | ජ්‍යෙ. සහකාර ලේඛකාධිකාරී<br>විභාග හා අධ්‍යයන අංශය,<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,<br>මිහින්තලේ' | 025-2266643/<br>45/46/50 - දිගුව 2142 |
| 02. | ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා දෙමාපිය භාරකරුවන් විසින් අත්සන් කොට එළැඹිය යුතු ප්‍රකාශය(*ඉහත ප්‍රකාශය නිසි පරිදි පුරවා ඉන් එක් පිටපතක් විශ්වවිද්‍යාලය වෙත එවිය යුතු අතර අනෙක් පිටපත දෙමාපිය/ භාරකරුවන් භාරයේ තබාගත යුතුය)* (SR 2) | | | |
| 03. | ශිෂ්‍ය තොරතුරු ලේඛනය (SR 3) | | ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂක<br>ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,<br>මිහින්තලේ' | |
| 04. | විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය හැඳුනුම්පත ලබාගැනීමේ අයදුම්පත (SR 4) | | ජ්‍යෙ. සහකාර ලේඛකාධිකාරී<br>ශිෂ්‍යසේවා අංශය<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,<br>මිහින්තලේ' | 025-3256349<br>හෝ<br>025-2266643/45/<br>46/50 දිගුව 2170 |
| 05. | නේවාසිකාගාර අයදුම්පත (SR 5) | | | |
| 06. | ශිෂ්‍යාධාර අයදුම්පත (SR 6) | | | |
| 07. | ශිෂ්‍ය වෛද්‍ය වාර්තාව (SR 7)<br>(ශිෂ්‍යා විසින් සම්පූර්ණ කළ යුතු කොටස) | | වෛද්‍ය නිලධාරී ,<br>වෛද්‍ය මධ්‍යස්ථානය,<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,<br>මිහින්තලේ' | 025-2266791 |
| 08. | ශිෂ්‍ය වෛද්‍ය වාර්තාව (SR 8)<br>(වෛද්‍ය පරීක්ෂණයන් අනුව වෛද්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු කොටස) | | | |

ජේ.එම්.පී.බී. අබේසිංහ
ලේඛකාධිකාරී